# ලිබරල් පක්ෂය

# ව්‍යවස්ථාව

# ලිබරල් පක්ෂයේ ව්‍යවස්ථාව

## පූර්විකාව

ශ්‍රී ලංකාවේ ලිබරල්වාදීන් වන අප ප්‍රචණ්ඩත්වය, මානව හිමිකම් උල්ලංඝනය, ජාතිවාදය, ත්‍රස්තවාදය සහ පුද්ගලයාගේ නිදහස යටපත් කිරීම සඳහා විවිධ උත්සාහයන් ගෙන ඇති සහ නියෝජන ප්‍රජාතාන්ත්‍රවාදය පහත දැමීමට කටයුතු කරන අවධියක කොළඹදී රැස්ව,

(අ) සැබෑ ලෙසම නිදහස් සාධාරණ එක්සත් සාමකාමී සහ සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් ලබාගත හැක්කේ අධිෂ්ඨානශීලීව, ලිබරල්වාදයේ මූලධර්ම වලට කැපවීම සහ ලිබරල් ප්‍රජාතාන්ත්‍රවාදී ව්‍යුහයක් තුලින් බවත් පිළිගෙන,

(ආ) ලිබරල් ප්‍රජාතාන්ත්‍රවාදී සංගමය විසින් ලිබරල්වාදය ඉහල දැමීම සඳහාත්, ශ්‍රී ලංකාව ලිබරල් ප්‍රජාතාන්ත්‍රවාදී ක්‍රමයක් ලෙස පවත්වාගෙන යාම සඳහාත් කල දායකත්වය පිළිගෙන,

(ඇ) අපගේ ව්‍යාපාරය විසින් ගෙන යනු ලැබූ ප්‍රගතිය තුලින් ලිබරල්වාදයට යොමුවූ දේශපාලන පක්ෂයක් අවශ්‍ය බව පිළිගෙන,

(ඈ) ලිබරල් පක්ෂයේ ව්‍යවස්ථාව ලෙස හඳුන්වන මෙම ව්‍යවස්ථාව කොළඹදී සම්මත කරගනිමු.

## 01 වන පරිච්ඡේදය

### සාමාන්‍ය

1 වන වගන්තිය: ලිබරල් පක්ෂය, ලිබරල්වාදය වර්ධනය කරන්නාවූද, ඉදිරියට දමන්නාවූද, ආරක්ෂා කරන්නාවූද කාර්යයට කැපවූ ශ්‍රී ලංකාවේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගැනීමට කටයුතු කරන්නාවූ දේශපාලන පක්ෂයකි.

2 වන වගන්තිය: ලිබරල් පක්ෂයේ මතවාදය වන්නේ දේශපාලන දර්ශනය තුල ලිබරල්වාදය ලෙස හඳුන්වන දර්ශණය වන අතර එය තවදුරටත් 1947 ලිබරල් ප්‍රකාශණයටද 1967 ඔක්තෝබරයේ ඔක්ස්ෆර්ඩ් ලිබරල් ප්‍රකාශණයටද අනුව පිළිගෙන ලිබරල් පක්ෂය, පුද්ගල නිදහසද, පාර්ලිමේන්තු ප්‍රජාතාන්ත්‍රවාදයද, නිදහස් වෙළඳ පොල ආර්ථිකයද, සුබ සාධන රාජ්‍යයක් සඳහාද කැපවේ. ලිබරල් පක්ෂය සියලු ආකාරයේ සාමූහිකවාදයද, අධිකාරිවාදයද, ජාතිවාදයද, පටු ජාතිකවාදයද, රාජ්‍යවාදයද සාමූහිකත්වයද ප්‍රතික්ෂේප කරයි.

3 වන වගන්තිය: ලිබරල් පක්ෂය ලොව පුරා ලිබරල්වාදීන් සමග ජාත්‍යන්තර සහයෝගිතාවය පවත්වාගෙන යන අතර සියලු රටවල මානව හිමිකම් උල්ලංඝනයටද, ජාතිවාදයටද, සාමූහිකවාදයටද, අධිකාරිවාදයටද එරෙහි වෙයි.

## 02 වන පරිච්ඡේදය

### සාමාජිකත්වය

4 වන වගන්තිය: වයස 16 ට වැඩි ඕනෑම පුද්ගලයෙකුට මෙම ව්‍යවස්ථාවේ තිබෙන උපලේඛණයේ දක්වා ඇති ලිබරල් මූලධර්ම පිලිගන්නාවූ අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් සහ ජාතික කාරක සභාව විසින් එකී අයදුම්පත පිලිගැනීමෙන්ද ලිබරල් පක්ෂයේ සාමාජිකත්වය ලබාගත හැක.

5 වන වගන්තිය: ලිබරල් පක්ෂයේ සාමාජිකත්වය නිසි ලෙස කැඳවන ලද ජාතික කාරක සභා රැස්වීමකින් සම්මත කිරීමෙන් පමණක් වලංගු වේ.

6 වන වගන්තිය: ලිබරල් පක්ෂයේ ජාතික කාරක සභාව මගින් සාමාජික අයදුම්පතක් ප්‍රතික්ෂේප කලහොත් එකී තීරණයට එරෙහිව එලෙස ප්‍රතික්ෂේප වූ තැනැත්තා විසින් ජාතික කාරක සභාව ඉදිරියේ පෙනීසිට තම අයදුම්පත පිලිගැනීම සඳහා හේතු ඉදිරිපත් කල හැක. ඉන්පසු ජාතික කාරක සභාව විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක සහ තීරණාත්මක වනු ඇත. කෙසේ වෙතත් වෙනත් කාරක සභා රැස්වීමක් මගින් එය වෙනස් කිරීමටද පුළුවන.

7 වන වගන්තිය: ජාතික කාරක සභාව විසින් සෑම සාමාජිකයෙකුටම වාර්ෂික සාමාජික මුදලක් හෝ යාවජීව සාමාජික මුදලක් ගෙවීමට නියම කල හැක.

8 වන වගන්තිය: සාමාජික මුදලක් ගෙවා ඇති සෑම අයෙකුටම පක්ෂය තුල තනතුරක් දැරීමට හැකියාවක් ලැබේ.

9 වන වගන්තිය: මෙම ව්‍යවස්ථාවේ පළමු පරිච්ඡේදයේ දක්වා ඇති මූලධර්ම වලට පටහැනිව කටයුතු සිදුකරන ව්‍යාපාරයක් ලිබරල් පක්ෂයේ ජාතික කාරක සභාවේ තුනෙන් දෙකක ඡන්දයක් ලබාගෙන ඉවත් කල හැක.

## 03 වන පරිච්ඡේදය

### ජාතික කාරක සභාව

10 වන වගන්තිය: ජාතික කාරක සභාව පක්ෂ නායක, සභාපති, උප සභාපතිවරු දෙදෙනෙක්, මහලේකම්, නියෝජ්‍ය මහ ලේකම්, භාණ්ඩාගාරික , ජාතික සංවිධායක ඇතුළු සාමාජිකයින් 15 දෙනෙකුගෙන්ද, ජාතික කාරක සභාව විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයින් 6 දෙනෙකුගෙන්ද සමන්විත විය යුතුය. (2005 ජාතික සම්මේලනයේදී මෙම ව්‍යවස්ථා සංශෝධනය සම්මත විය. මුල් ව්‍යවස්ථාවේ සිටි කාරක සභිකයින් සංඛ්‍යාව 13 කි. 2005 දී එය 21 දෙනෙකු දක්වා වැඩි කරන ලදී. 2012 ව්‍යවස්ථා සංශෝධනයක් මගින් ජාතික සංවිධායක ධූරය ඇති කරන ලදී.)

| | |
|---|---|
| 11 වන වගන්තිය: | ජාතික කාරක සභාව ලිබරල් පක්ෂයේ ප්‍රතිපත්ති සකස් කරන සහ පරිපාලන කටයුතු ගෙන යන ඉහලම මණ්ඩලය වේ. එයට ප්‍රතිපත්ති තීරණය කිරීමටත්, වෙනස් කිරීමටත්, පක්ෂය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඕනෑම තීරණයක් ගැනීමටත් හැක. |
| 12 වන වගන්තිය: | ලිබරල් පක්ෂයේ ජාතික කාරක සභාවක්, මහ ලේකම්, සභාපති හෝ නායක විසින් කැඳවිය හැක. එමෙන්ම සාමාජිකයින් 4 දෙනෙකු විසින් මහ ලේකම්වරයාට ඉල්ලීමක් කිරීමෙන් මහ ලේකම්වරයා විසින් කැඳවිය හැක. |
| 13 වන වගන්තිය: | ජාතික කාරක සභාව විසින් පක්ෂ ශාඛා පිහිටුවීම, පළාත්, දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ශාඛා පිහිටුවීම අනුමත කල යුතුය. |
| 14 වන වගන්තිය: | ජාතික කාරක සභාව විසින් දේශපාලන ප්‍රතිපත්ති සහ පරිපාලන ප්‍රතිපත්ති විශලේෂණය කර තීරණය කිරීම සඳහා විශේෂ කමිටු පත්කල හැක. |
| 15 වන වගන්තිය: | ජාතික කාරක සභාවේ තනතුරු දරණ සියලු සාමාජිකයින් මහා සම්මේලනයේදී ඡන්දයෙන් පත් කරන අතර ඔවුන්ද, තනතුරු නොදරන සාමාජිකයින්ද ඊලග වාර්ෂික සම්මේලනය පවත්වනතෙක් ධූර දරති. |

## 04 වන පරිච්ඡේදය

### ජාතක කාරක සභාවේ නිලධාරීන් සහ අනෙකුත් සාමාජිකයින්

| | |
|---|---|
| 16 වන වගන්තිය:(අ) | පක්ෂ නායකවරයා වාර්ෂික මහා සම්මේලනයේදී හෝ එම සම්මේලනයෙන් පසු පවත්වන ප්‍රථම ජාතික කාරක සභාවේදී ඡන්දයෙන් පත්කරනු ලැබිය යුතුය. |
| (ආ) | පක්ෂ නායකවරයාට නායක ධූරයට අමතරව කාරක සභාවේ වෙනත් තනතුරක්ද දැරිය හැක. |
| (ඇ) | පක්ෂ සභාපති වාර්ෂික මහා සම්මේලනයේදී ඡන්දයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතුය. |
| 17 වන වගන්තිය: | ලිබරල් පක්ෂයේ සියලුම රැස්වීම් සභාපතිවරයා විසින් මුලසුන දරනු ඇත. |
| 18 වන වගන්තිය: | උප සභාපතිවරු දෙදෙනෙකුට වඩා නොසිටිය යුතු අතර ඔවුහු ඡන්දයක් මගින් වාර්ෂික මහා සම්මේලනයේදී තෝරාගත යුතුය. |

19 වන වගන්තිය: සභාපතිවරයා නොමැති විටක උප සභාපතිවරු විසින් සභාපතිවරයාගේ කාර්යයන් සහ යුතුකම් ඉටුකල යුතුය. එමෙන්ම මහ ලේකම්වරයා විසින් පවරනු ලබන විශේෂ කාර්යයන්ද ඉටු කල යුතුය.

20 වන වගන්තිය: මහ ලේකම්වරයා වාර්ෂික මහා සම්මේලනයේදී ඡන්දයෙන් තෝරා පත්කල යුතුය.

21 වන වගන්තිය: මහ ලේකම්වරයා පක්ෂයේ ප්‍රධාන විධායක නිලධාරියා වේ. මහ ලේකම්වරයා ජාතික කාරක සභාවට වගකිව යුතු අතර මහ ලේකම්වරයාට විධායක සහ පරිපාලන තීරණ ගැනීමට බලය ඇත. මහ ලේකම්වරයා ලිබරල් පක්ෂ කාර්යාලය සහ එහි සේවයේ නියුතු කාර්ය මණ්ඩලය පිළිබඳව වගකීම දරයි.

22 වන වගන්තිය: මෙම ව්‍යවස්ථාව පරිදි යම් කාරක සභිකයෙකුට දී ඇති යම් වගකීමකට අමතරව පක්ෂ නායක විසින් ජාතික කාරක සභාවේ ඕනෑම සාමාජිකයෙකුට යම් වෙනත් වගකීමක් පැවරිය හැක.

23 වන වගන්තිය: ලිබරල් පක්ෂයේ කිසිම නිලධාරියෙකු තම වගකීමෙන් ඔබ්බට ගිය තීරණ ගැනීමක් හෝ ක්‍රියාකාරකමක් සිදු නොකල යුතුය. එසේ වුවද ජාතික කාරක සභාවේ අනුමැතිය මත යම් ක්‍රියාකාරිත්වයක යෙදිය හැකි අතර කාලය පිළිබඳ ගැටළුවක් තිබේනම් නායකතුමාගේ අනුමැතිය යටතේ සුදුසු පරිදි කටයුතු කල හැක.

24 වන වගන්තිය: නියෝජ්‍ය මහ ලේකම්වරයා වාර්ෂික මහා සම්මේලනයේ ඡන්ද විමසීමකින් පසු තෝරා පත්කල යුතුය.

25 වන වගන්තිය: නියෝජ්‍ය මහ ලේකම්වරයා පක්ෂයේ පරිපාලනය භාර නිලධාරියා වේ. ඔහු සාමාජික ලැයිස්තුව පවත්වාගෙන යා යුතුය. සාමාජිකයින් වෙත සියලු දැන්වීම් යැවිය යුතුය. ජාතික කාරක සභාවේ සාමාන්‍ය රැස්වීම්, විශේෂ රැස්වීම් තැබිය යුතුය. මේ හැර මහ ලේකම්වරයා විසින් පවරන යම් කාර්යයක් ඉටුකල යුතුය. මහ ලේකම්වරයා රටින් බැහැරව සිටින විට එම ධූරයේ සියලු වගකීම් සහ කාර්යයන් ඔහු විසින් ඉටුකල යුතුය.

26 වන වගන්තිය: මහලේකම් වරයාගේ ධූරය හිස් වූ විටක සභාපති, උප සභාපතිවරු සහ නියෝජ්‍ය මහ ලේකම්වරයා විසින් මහ ලේකම් ධූරයේ බලතල සහ කාර්යයන් ඒකාබද්ධව සිදුකරනු ඇත.

27 වන වගන්තිය: භාණ්ඩාගාරිකවරයා වාර්ෂික මහා සම්මේලනයේදී ඡන්දයෙන් තෝරාගත යුතුය

28 වන වගන්තිය: භාණ්ඩාගාරිකවරයා ලිබරල් පක්ෂයේ මුදල් පිළිබඳව වගකියන අතර පක්ෂයේ ගිණුම් පවත්වාගෙන යෑමද, ඒවා පවත්වාගෙන යාමට කටයුතු කිරීමද, අරමුදල් එකතු කිරීමේ ක්‍රම සංවිධානය කිරීම සහ ප්‍රගුණ කිරීමද, සිදු කරන අතර බැංකු

ගිණුම්, තැන්පත් හා මූල්‍යමය ආයෝජන පිළිබඳව ජාතික කාරක සභාවට වගකිව යුතුය.

28 (අ) ජාතික සංවිධායකවරයා මහා සම්මේලනයේදී හෝ ඉන්පසු පවත්වන ප්‍රථම ජාතික කාරක සභා රැස්වීමේදී තෝරා පත්කරගත යුතුය. ජාතික සංවිධායකවරයාට ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා, පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාශ සහ දිස්ත්‍රික් මට්ටමින් පක්ෂ සංවිධාන පිහිටුවීමේ බලය ඇති අතර එම සංවිධාන කටයුතු වලදී පක්ෂ නායක, මහ ලේකම්වරයා සහ සභාපතිවරයා දැනුවත් කල යුතුය. තවද පක්ෂයේ සම්මන්ත්‍රණ, දේශණ, ප්‍රවෘත්ති සාකච්ඡා සහ ජනහමු පැවැත්වීමද, ජාත්‍යන්තර ශාඛා පිහිටුවීමේ බලයද, තරුණ, කාන්තා සහ වෘත්තීය සමිති කටයුතු සංවිධානය කිරීමේ බලයද ඇත.

29 වන වගන්තිය: නිලතල නොදරන ඉතිරි සාමාජිකයින් වාර්ෂික මහා සම්මේලනයේදී ඡන්දයෙන් තෝරාපත්කර ගත යුතුය.

30 වන වගන්තිය: නිලතල නොදරන කමිටු සාමාජිකයින්ට ජතික කාරක සභාව විසින් විශේෂ තනතුරු හෝ වගකීම් පැවරිය හැක.

31 වන වගන්තිය: වාර්ෂික සම්මේලනය පැවැත්වීමට දින 14 කට පෙර තම කැමැත්ත දක්වන ලිඛිත ප්‍රකාශයක් මහ ලේකම්වරයා වෙත යොමුකිරීමෙන් ජාතික කාරක සභා තනතුරකට ඉල්ලුම්කල හැක.

32 වන වගන්තිය: (අ) නායක, ජාතික සංවිධායක, සභාපති, මහලේකම් සහ නියෝජ්‍ය ලේකම් ධූරයට එක් තැනැත්තෙකුට වැඩියෙන් හෝ උප සභාපතිධූරයට තැනැත්තන් දෙදෙනෙකුට වැඩියෙන් නාම යෝජනා ලැබුනහොත් එම සාමාජිකයින්ට වාර්ෂික මහා සම්මේලනයේදී තම අපේක්ෂකත්වය තහවුරු කරමින් අදහස් ප්‍රකාශ කල හැක.

(ආ) සභාපතිවරයා හෝ ඔහු/ඇය විසින් පත්කරනු ලබන වෙනත් සාමාජිකයකු තේරීම්භාර නිලධාරි ලෙස කටයුතු කල යුතුය.

33 වන වගන්තිය: ජාතික කාරක සභාවේ රැස්වීමක ගණපූර්ණය 4 ක් විය යුතු අතර එහිදී නායක, සභාපති, මහ ලේකම්වරයාද ඇතුළු තවත් සාමාජිකයෙකු ඒ සඳහා සහභාගිවිය යුතුය.

34 වන වගන්තිය: ජාතික කාරක සභාවේ නිල දරණ හෝ නිල නොදරන සාමාජිකයෙකුගේ ධූරය මරණය, ඉල්ලා අස්වීම, හෝ විශේෂ මහ සභා රැස්වීමකදී කරනු ලබන යෝජනා සම්මතයක් මත හෝ ලිබරල් පක්ෂ සාමාජිකත්වය නතර වුවහොත් හිස්වේ.

35 වන වගන්තිය: ජාතික කාරක සභා තීරණයක් වාර්තාගත සියලු සාමාජිකයන්ගේ තීරණයක් මගින් ආපසු වෙනස් කල හැක.

## 05 වන පරිච්ඡේදය

### වාර්ෂික මහා සම්මේලනය හා විශේෂ මහා සභා රැස්වීම්

36 වන වගන්තිය: ලිබරල් පක්ෂයේ වාර්ෂික මහා සම්මේලනය සෑම වර්ෂයකම දෙසැම්බර් මාසයේදී පැවැත්විය යුතුය. (වර්ෂ 2011 වාර්ෂික මහා සම්මේලනයේදී සංශෝධනය කරන ලද අතර ඊට පෙර අප්‍රේල් මාසයේදී පැවැත්විය යුතු බවට මුල් ව්‍යවස්ථාවේ සඳහන්ව තිබුණි.)

37 වන වගන්තිය: නියෝජ්‍ය මහ ලේකම්වරයා විසින් වාර්ෂික මහා සම්මේලනය පිළිබඳව පවත්වන්නට යෙදෙන දිනට දින 21 කට පෙර ඒ පිළිබඳව සාමාජිකත්වයට දැනුම්දිය යුතුය.

38 වන වගන්තිය: සම්මත කර ගැනීමට බලාපොරොත්තු වන යෝජනා වාර්ෂික මහා සම්මේලනය පවත්වන දිනට දින 14 කට පෙර මහ ලේකම්වරයා හෝ නියෝජ්‍ය මහ ලේකම්වරයා වෙත ලිඛිතව දැන්විය යුතුය.

39 වන වගන්තිය: නියෝජ්‍ය ලේකම්වරයා විසින් වාර්ෂික මහා සම්මේලනයේදී විවාද කරනු ලැබීමට නියමිත යෝජනා ද තනතුරු අපේක්ෂක ලැයිස්තුව පිටපත් අවම වශයෙන් සම්මේලනට දින 7 කට පෙර ලබාදිය යුතුය.

40 වන වගන්තිය: වාර්ෂික සම්මේලනයේ මුලසුන දැරීම සභාපතිවරයා විසින් කරනු ලබයි. සභාපතිවරයා නොමැති විටක උප සභාපතිවරයෙකු විසින්ද උප සභාපතිවරයෙකු නොමැති නම් මහ ලේකම්වරයා විසින්ද එහි මුලසුන දරනු ඇත.

41 වන වගන්තිය: සභාපතිවරයා විසින් හෝ මුලසුන දරණ නිලධාරියා විසින් සියලු පටිපාටිමය ප්‍රශ්ණ විසදිය යුතු අතර විවිධ මත සහ අදහස් වලට සවන්දීමෙන් පසු අවශ්‍ය තීරණ ගත යුතුය.

42 වන වගන්තිය: වාර්ෂික මහා සම්මේලනයේදී සභාපතිවරයා හෝ මුලසුන දරණ සාමාජිකයා විසින් ගනු ලබන තීරණයක් සාමාජිකයන් දස දෙනෙකු විසින් ලිඛිතව දැනුම්දීමෙන් අභියෝග කල හැක. එවැනි ගැටළුවක් ඡන්ද විමසීමකින් තීරණය කල යුතුය. යම් තැනැත්තෙකුගේ හැසිරීම විවාදයට ලක් වන්නේ නම් ඔහු/ඇය විසින් එවැනි රැස්වීමක මුලසුන නොදැරිය යුතුය.

43 වන වගන්තිය: සාමාජිකයන් 20 දෙනෙකුගේ කැමැත්ත මත වර්ෂික මහා සම්මේලනයේදී විශේෂ යෝජනාවක් සාකච්ඡා කර තීරණය කල හැක.

44 වන වගන්තිය:(අ) නායකතුමන් විසින් වාර්ෂික මහා සම්මේලනය ඇමතිය යුතුය.

(ආ) පක්ෂ මහ ලේකම්වරයා විසින් පසුගිය වසරක කාලය සඳහා පක්ෂය ගෙන ගිය වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක් සහ පක්ෂයේ ඉදිරි කටයුතු පිළිබඳව සුදුසු යැයි සැලකෙන කරුණු සම්මේලනය වෙත ඉදිරිපත් කල යුතුය.

45 වන වගන්තිය: භාණ්ඩාගාරික විසින් පසුගිය වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතු අතර පක්ෂයේ ඉදිරි මුදල් කටයුතු පිළිබඳ තම අදහස් ඉදිරිපත් කල හැක.

46 වන වගන්තිය: සාමාජිකයන් විසින් නිලතල දැරූ සාමාජිකයන් වෙත ඔවුන්ගේ කාර්යයන් ඉටුකල ආකාරය පිළිබඳව ප්‍රශ්ණ ඉදිරිපත්කල හැක.

47 වන වගන්තිය: මහ ලේකම්වරයා හෝ නියෝජ්‍ය මහ ලේකම්වරයා විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැක.

48 වන වගන්තිය: සාමාජිකයන් විසි දෙනෙකු විසින් සභාපතිවරයාට හෝ මහ ලේකම්වරයාට දැනුම්දීමෙන් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැක.

49 වන වගන්තිය: විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීමට දින පහකට පෙරවත් ඒ පිළිබඳව ජාතික පුවත්පත් දෙකකවත් දැන්වීමක් පලකිරීමට නියෝජ්‍ය මහලේකම්වරයා කටයුතු කල යුතුය.

## 06 වන පරිච්ඡේදය

### විශේෂ කරුණු

50 වන වගන්තිය: මෙම ව්‍යවස්ථාවේ සලකා බලා නොමැති කරුණක් ජාතික කාරක සභාව විසින් තීරණය කල යුතුය.

## 07 වන පරිච්ඡේදය

### අන්තර්කාලීන විධිවිධාන

51 වන වගන්තිය: ලිබරල් පක්ෂය ආරම්භ කරන අවස්ථාවේදී ලිබරල් ප්‍රජාතාන්ත්‍රවාදී සංගමයේ සිටින සාමාජිකයින් පක්ෂ නිලධාරීන් බවට පත්වේ.

52 වන වගන්තිය: පළමු ජාතික කාරක සභාව පළමු වාර්ෂික සම්මේලනයේදී නැවත ඡන්දයෙන් පත්කල යුතුය.

## 08 වන පරිච්ඡේදය

### ව්‍යවස්ථා සංශෝධන

53 වන වගන්තිය: ඕනෑම සාමාජිකයෙකුට මහ ලේකම්වරයා වෙත හෝ නියෝජ්‍ය මහ ලේකම්වරයා වෙත යවනු ලබන ලිඛිත නිවේදනයක් මගින් ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කල හැක.

54 වන වගන්තිය:(අ) ව්‍යවස්ථා සංශෝධනය සඳහා නියෝජ්‍ය මහ ලේකම්වරයා විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැදවිය හැකි වන අතර ඒ පිළිබඳව දින 21 කට පෙර සාමාජිකත්වයට දැනුම් දිය යුතුය.

(ආ) නියොජ්‍ය මහ ලේකම්වරයා විසින් එකී ව්‍යවස්ථා සංශෝධනයේ පිටපතක් එකී විශේෂ මහා සභා රැස්වීමට දින 14 කට පෙර සාමාජිකයන් වෙත යැවිය යුතුය.

55 වන වගන්තිය: විශේෂ මහා සභා රැස්වීමේදී 1 වන පරිච්ඡේදයේ වගන්ති හැර ව්‍යවස්ථාවේ ඕනෑම වගන්තියක් සංශෝධනය කල හැක.

56 වන වගන්තිය: මෙම ව්‍යවස්ථාවේ 1 වන පරිච්ඡේදය වගන්ති හා පළමු උපලේඛණයේ වගන්ති වාර්තාගත සාමාජිකයන්ගෙන් සියයට 75 ක්ද, නායකයාද, සභාපති හා මහ ලේකම්වරයාද සහභාගි වීමෙන් හැර සංශෝධනය කල නොහැක.

## <u>උපලේඛණය</u>

පහත අත්සන් කරන මම ලිබරල්වාදයේ ප්‍රතිපත්ති පිළිගන්නා අතර පෞද්ගලික නිදහස, නියෝජිත ප්‍රජාතාන්ත්‍රවාදය සහ සුබ සාධක රාජ්‍ය මත පදනම් වූ නිදහස් අලෙවි ආර්ථිකය සහ ජාති වාදයෙන් තොර නිදහස් හා සාධාරණ ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමට කැප වන බව පැහැදිලිව ප්‍රකාශ කරමි. එහෙයින් මම ලිබරල්පක්ෂයේ සාමාජිකත්වය ලැබීමට කැමැත්තෙමි.

*(වර්ෂ එක් දහස් නවසිය අසූ හතක් වූ ජනවාරි දහනව වන සඳුදා මෙම ව්‍යවස්ථාව කොළඹදී සම්මත කරගන්නා ලදී.)*

# ලිබරල් පක්ෂය
# லிபரல் கட்சி
# The Liberal Party
(Sri Lanka)

23," Sridevi", Amunawatta,
Kurunegala.
Sri Lanka.
Tel: 037-2233573, 077-7733347
E-mail : kamalliberal@yahoo.com Web: www.liberallanka.org

*මහ ලේකම්*
*නීතිඥ කමල් නිශ්ශංක*
*23, "ශ්‍රීදේවි",*
*අමුණවත්ත,*
*කුරුණෑගල.*

*Secretary General*
Mr. Kamal Nissanka, BA (Hon), AAL
*Tel: 037-2233573 , 077-7733347*


වර්ෂ 2019 දෙසැම්බර් 29 වන දින කුරුණෑගල, අමුණවත්ත, අංක 23 දරණ ස්ථානයෙහි පැවති ලිබරල් පක්ෂයේ 32වන වාර්ෂික සම්මේලනය ව්‍යවස්ථාදායක සභාවක් ලෙස පත් වෙමින් සම්මත කරගන්නා ලද ලිබරල් පක්ෂ ව්‍යවස්ථා සංශෝධනය,

ලිබරල් පක්ෂ ව්‍යවස්ථාවේ 10 වන වගන්තියට කරනු ලබන සංශෝධනයයි.

10 වන වගන්තිය පහත දක්වන ආකාරයට සංශෝධනය කරනු ලබයි

(10) වන වගන්තිය ජාතික කාරක සභාව නායක, සභාපති, උප සභාපතිවරු පහකට නොවැඩි සංඛ්‍යාවකින්ද, මහලේකම්වරයාගෙන්ද, නියෝජ්‍ය ලේකම්වරයාගෙන්ද, භාණ්ඩාගාරිකවරයාගෙන්ද, ජාතික සංවිධායකවරයාගෙන්ද, ඡන්දයෙන් තෝරා පත්කර ගන්නා සභිකයන් හත් දෙනෙකුගෙන් සහ වාර්ෂික සම්මේලනයෙන් පසු රැස්වන පළමු කාරක සභාව විසින් පත්කරන සභිකයන් තුන් දෙනෙකුගෙන්ද සමන්විත වේ. සියළුම ජාතික කාරක සභිකවරු ඡන්ද කොට්ඨාශ මට්ටමේ හෝ දිස්ත්‍රික් මට්ටමේ සංවිධායකයන් විය යුතුය.

( වර්ෂ 2019.12.29 වන දින කුරුණෑගල දී පැවති වාර්ෂික මහා සම්මේලනය, ව්‍යවස්ථාදායක සභාවක් බවට පත්වී මෙම සංශෝධනය කරනු ලැබීය. )

කමල් නිශ්ශංක
මහලේකම්
ලිබරල් පක්ෂය